අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/12/06/01/05 ඔබේ යොමුව / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2018.09.26

චක්‍රලේඛ අංක - 38/2018

සියලු ම පළාත් ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කළාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නි.අ.අ./ස.අ.අ.වරුන්,
සියලු ම පරිවේණාධිපති හිමිවරුන්,
සියලු ම රජය හා රජය අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් වෙත.

## පාසල් වාර සටහන - 2019

01. 2019 වර්ෂය තුළ අනුගමනය කළ යුතු පාසල් වාර සටහන සහ අදාළ විස්තර පහත දැක්වේ.

**I. සිංහල හා දෙමළ පාසල් සඳහා**

| | |
|---|---|
| පළමුවන වාරය | 2019 ජනවාරි මස 02 වන බදාදා සිට 2019 අප්‍රේල් මස 05 වන සිකුරාදා දක්වා (දෙදින ම ඇතුළු ව) |
| දෙවන වාරය | 2019 අප්‍රේල් මස 22 වන සඳුදා සිට 2019 අගෝස්තු මස 01 වන බ්‍රහස්පතින්දා දක්වා (දෙදින ම ඇතුළු ව) |
| තෙවන වාරය | 2019 සැප්තැම්බර් මස 02 වන සඳුදා සිට 2019 නොවැම්බර් මස 29 වන සිකුරාදා දක්වා (දෙදින ම ඇතුළු ව) |

**II. මුස්ලිම් පාසල් සඳහා**

| | |
|---|---|
| පළමුවන වාරය | 2019 ජනවාරි මස 02 වන බදාදා සිට 2019 අප්‍රේල් මස 11 වන බ්‍රහස්පතින්දා දක්වා (දෙදින ම ඇතුළු ව) |
| දෙවන වාරය | <u>පළමු වන අදියර</u><br>2019 අප්‍රේල් මස 17 වන බදාදා සිට 2019 මැයි මස 03 වන සිකුරාදා දක්වා (දෙදින ම ඇතුළු ව) |
| | **(රාමසාන් උපවාසය සඳහා 2019.05.04 සිට 2019.06.09 දක්වා නිවාඩු ලබා දෙනු ලැබේ.)** |
| | <u>දෙවන අදියර</u><br>2019 ජූනි මස 10 සඳුදා සිට 2019 අගෝස්තු මස 09 සිකුරාදා දක්වා (දෙදින ම ඇතුළු ව) |
| තෙවන වාරය | 2019 අගෝස්තු මස 15 වන බ්‍රහස්පතින්දා සිට 2019 නොවැම්බර් මස 29 වන සිකුරාදා දක්වා (දෙදින ම ඇතුළු ව) |

**කරු.අ.පි.බ.**

02. ඒ ඒ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවලට තම පළාත්වල සුවිශේෂී තත්වයනට අනුකූලව පාසල් වාර සටහන වෙනසක් කළ යුතු බව අදහස් කරන්නේ නම් පහත සඳහන් කොන්දේසි වලට යටත්ව හා 1997 අගෝස්තු මස 08 දිනැති 97/15 දරණ චක්‍රලේඛයට අනුව මෙම වාර සටහන වෙනස් කර ගත හැකිය.

2.1 පාසල් වාර සටහන සම්බන්ධයෙන් නිකුත් කර ඇති 97/15 චක්‍රලේඛයට අනුව ලංකාවේ සියලුම පාසල් දින 210ක් පැවැත්විය යුතු බව අවධාරණය කර ඇතත්, 2019 වර්ෂයට යෙදෙන රජයේ නිවාඩු දිනයන් අනුව දින 210ක් පාසල් පැවැත්වීමට නොහැකි වී ඇත. එබැවින් 2019 වර්ෂය සඳහා රජයේ හා රජයේ අනුමත සියලු ම පෞද්ගලික පාසල් හා අනුමත පිරිවෙන්, දින 197ක් පැවැත්විය යුතු වේ.

2.2 2019 වර්ෂයේ අ.පො.ස. (උ/පෙළ) විභාගය අගෝස්තු මාසය තුළ හා අ.පො.ස. (සා/පෙළ) විභාගය දෙසැම්බර් මාසය තුළ දී පැවැත්වීමට නියමිතව ඇති බැවින්, පාසල්වල අගෝස්තු හා දෙසැම්බර් නිවාඩු කාල සීමාවන් වාර සටහනෙහි දක්වා ඇති ආකාරයෙන් ම පැවැත්විය යුතු වේ.

03. රජය මඟින් ප්‍රකාශිත ප්‍රසිද්ධ නිවාඩු දින, සෙනසුරාදා, ඉරිදා දිනයන් හා වාර නිවාඩු කාලයන් තුළ සියලු ම පාසල් වසනු ලැබේ. එහෙත් සුවිශේෂී හේතුවක් මත පාසල පැවැත්විය යුතු දිනයක පාසල වැසීමට සිදු වුවහොත් එම දින සඳහා හිලව් සැසි පැවැත්විය යුතු වේ.

04. 2019 වර්ෂයට අදාළ රජයේ නිවාඩු දින දර්ශනය මේ සමඟ ඔබ වෙත යොමු කරන අතර (ඇමුණුම- I), පාසල් ක්‍රියාකාරකම් ඇතුළත් දින දර්ශනය ඉදිරියේ දී මුද්‍රිත වාර සටහන් පොත සමඟ ඔබ වෙත එවීමට කටයුතු කරනු ලැබේ.

මෙම වාර සටහන ක්‍රියාත්මක කිරීමේ දී යම් ගැටළුවක් පැන නැගුණහොත් ඒ සම්බන්ධයෙන් පාසල් කටයුතු ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් විමසන මෙන් කාරුණිකව ඉල්ලමි.

දුරකථන අංක - 011- 2784845

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :-

01. අධ්‍යක්ෂ ජනරාල් (ජාතික අධ්‍යාපන ආයතනය)
02. විභාග කොමසාරිස් ජනරාල්
03. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
04. ප්‍රධාන කොමසාරිස් - අධ්‍යාපන විද්‍යාපීඨ ශාඛාව
05. අධ්‍යාපන අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් හා ශාඛා ප්‍රධානීන්
06. සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
07. සභාපති, මධ්‍යම ගමනාගමන මණ්ඩලය

# රජයේ නිවාඩු දින - 2019

| | | | | |
|---|---|---|---|---|
| ජනවාරි | 15 | අඟහරුවාදා | දෙමළ තෛපොංගල් දිනය | * = |
| ජනවාරි | 20 | ඉරිදා | දුරුතු පුර පසළොස්වක | * = |
| පෙබරවාරි | 04 | සඳුදා | ජාතික නිදහස් දිනය | * = |
| ජනවාරි | 19 | අඟහරුවාදා | නවම් පුර පසළොස්වක | * = |
| මාර්තු | 04 | සඳුදා | මහා සිව රාත්‍රී දිනය | * = |
| මාර්තු | 20 | බදාදා | මැදින් පුර පසළොස්වක | * = |
| අප්‍රේල් | 13 | සෙනසුරාදා | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනට පෙර දිනය | * = |
| අප්‍රේල් | 14 | ඉරිදා | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනය | * = |
| අප්‍රේල් | 19 | සිකුරාදා | බක් පුර පසළොස්වක | * = |
| අප්‍රේල් | 19 | සිකුරාදා | මහ සිකුරාදා දිනය | * = |
| මැයි | 01 | බදාදා | ලෝක කම්කරු දිනය | * = |
| මැයි | 18 | සෙනසුරාදා | වෙසක් පුර පසළොස්වක | * = |
| මැයි | 19 | ඉරිදා | වෙසක් පුර පසළොස්වක දිනට පසු දිනය | * = |
| ජූනි | 05 | බදාදා | ඊදුල් පිතර් (රාමසාන් දිනය) | * = |
| ජූනි | 16 | ඉරිදා | පොසොන් පුර පසළොස්වක | * = |
| ජූලි | 16 | අඟහරුවාදා | ඇසළ පුර පසළොස්වක | * = |
| අගෝස්තු | 12 | සඳුදා | ඊදුල් අල්හා (හජ්ජි උත්සව දිනය) | * = |
| අගෝස්තු | 14 | බදාදා | නිකිණි පුර පසළොස්වක | * = |
| සැප්තැම්බර් | 13 | සිකුරාදා | බිනර පුර පසළොස්වක | * = |
| ඔක්තෝබර් | 13 | ඉරිදා | වප් පුර පසළොස්වක | * = |
| ඔක්තෝබර් | 27 | ඉරිදා | දීපවාලී උත්සව දිනය | * = |
| නොවැම්බර් | 10 | ඉරිදා | (මිලා-දුන්-නබි) නබි නායකතුමාගේ උපන් දිනය | * = |
| නොවැම්බර් | 12 | අඟහරුවාදා | ඉල් පුර පසළොස්වක | * = |
| දෙසැම්බර් | 11 | බදාදා | උඳුවප් පුර පසළොස්වක | * = |
| දෙසැම්බර් | 25 | බදාදා | නත්තල් උත්සව දිනය | * = |

* රජයේ නිවාඩු දින = බැංකු නිවාඩු දින